රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 31/2019

මගේ අංකය : CS/SLAS/AMEN/MINUT (IV) වෙළුම
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු
සම්පත් සංවර්ධන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.
2019 ඔක්තෝබර් මස 04 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2137/5 හා 2019.08.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඇතුලත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම</u>**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන (II) ශ්‍රේණියට සහ දෙවන (II) ශ්‍රේණියේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීමේ අවම සේවා කාලය සංශෝධනය කිරීමට අදාළ විධිවිධාන ඇතුලත් කර අංක 2137/5 හා 2019 අගෝස්තු 19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවේ හයවන සේවා ව්‍යවස්ථා සංශෝධනය අනුව දැනට සේවයේ සිටින ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ගේ ශ්‍රේණි උසස් කිරීම් පහත පරිදි සිදු කරනු ලැබේ.

**01.** තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන (II) ශ්‍රේණියට උසස් කිරීම.

**1.1)** 2019 පෙබරවාරි මස 26 දිනට පෙර සේවයට බඳවා ගෙන ඇති නිලධාරීන් සංශෝධිත ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 13.1.1. (අ) හී අනු අංක vii යටතේ සඳහන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන හැකියා ප්‍රවර්ධන මට්ටම - III පාඨමාලාව සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය හැර 13.1.1. (අ) යටතේ සඳහන් අනෙකුත් සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දිනය හෝ 2019 පෙබරවාරි මස 26 දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

**1.2)** සංශෝධිත ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 13.1.1. (අ) හී අනු අංක v යටතේ දක්වා ඇති අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති සහන කාලය තුල සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් නියමිත දිනට අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කරනු ලැබූ නිලධාරීන් ලෙස සලකනු ලැබේ.

**1.3)** සංශෝධිත ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 13.1.1. (අ) හී අනු අංක v යටතේ දක්වා ඇති අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති සහන කාලය තුල සම්පූර්ණ නොකරනු ලබන නිලධාරීන් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ඇතුලුව මෙම චක්‍රලේඛනයේ 1.1 හී සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

**02.** දෙවන (II) ශ්‍රේණියේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීම.

**2.1) සේවා ව්‍යවස්ථාවේ හයවන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට II ශ්‍රේණියේ සිටින නිලධාරීන්ට සහ III වන ශ්‍රේණියේ වසර හය (06) කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට**

**(අ).** II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් වීම සඳහා ලබා තිබිය යුතු 13.2 (අ) හී අනු අංක I යටතේ සඳහන් පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කර ගැනීම සඳහා මෙම චක්‍රලේඛය ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට වසර පහ (05) ක කාල සීමාව සහන කාලයක් ලබා දෙනු ලබන අතර එම සහන කාල සීමාව තුලදී පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව 13.2 (අ) යටතේ සඳහන් අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

**(ආ) II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් වීම සඳහා ලබා තිබිය යුතු 13.2 (අ) හි අනු අංක v යටතේ වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර ගැනීම සඳහා II ශ්‍රේණියට උසස් කරනු ලැබූ දිනයේ සිට වසර තුන (03) ක සහන කාලයක් ලබා දෙන අතර එම සහන කාලය සීමාව තුලදී අදාළ සුදුසුකම සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව 13.2 (අ) යටතේ සඳහන් අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.**

**2.2)** සේවා ව්‍යවස්ථාවේ හයවන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට II ශ්‍රේණියේ සිටින නිලධාරීන් (I) ශ්‍රේණියට උසස් කිරීමේදී 13.2(අ) හි ii සහ iv යටතේ සඳහන් කර සුදුසුකම් වෙනුවට පහත සුදුසුකම් සලකා බලනු ලැබේ.

**(අ.)** II ශ්‍රේණියේ වසර දෙකක (02) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා II ශ්‍රේණියට උසස්වීමෙන් පසු වැටුප් වර්ධක දෙකක් (02) ක් උපයාගෙන තිබීම.

**(ආ.)** අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව II ශ්‍රේණියට උසස්වීමෙන් පසු උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දෙකක් (02) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

**2.3)** සේවා ව්‍යවස්ථාවේ හයවන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට III වන ශ්‍රේණියේ වසර හය (06) කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මෙම චක්‍රලේඛයේ 1.1. හී දක්වා ඇති විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් (I) ශ්‍රේණියට උසස් කිරීමේදී 13.2(අ) හී ii සහ iv යටතේ සඳහන් කර සුදුසුකම් වෙනුවට පහත සුදුසුකම් සලකා බලනු ලැබේ.

**(අ.)** III සහ II ශ්‍රේණිවල වසර දොලහ (12) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක එකොළහ (11) ක් උපයාගෙන තිබීම.

**(ආ.)** අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දොලහ (12) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

**සටහන**

2019 පෙබරවාරි මස 26 දිනට පෙර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියේ වසර හය (06) කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මෙම චක්‍රලේඛයේ 1.3 හී සඳහන් විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස් කරනු ලැබූ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමේදී එම නිලධාරීන් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීම සඳහා ගනු ලැබූ අමතර කාල සීමාවට සමාන කාල සීමාවකින් එම නිලධාරීන්ගේ I ශ්‍රේණියට උසස් කිරීම ප්‍රමාද කරනු ලැබේ.

**2.4)** 2019 පෙබරවාරි මස 26 දිනට පෙර සේවයට බඳවා ගෙන ඇති මෙම චක්‍රලේඛයේ අනු අංක i යටතේ සඳහන් විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස්කර ඇති නිලධාරීන් I ශ්‍රේණියට උසස්වීමට පෙර සංශෝධිත ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 13.1.1. (අ) හී අනු අංක vii යටතේ සඳහන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන හැකියා ප්‍රවර්ධන මට්ටම - III පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර සහතිකය ලබා තිබිය යුතුය.

**2.5)** 2019 පෙබරවාරි මස 26 දිනට පෙර සේවයට බඳවා ගෙන ඇති නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමේදී 13.2 (අ) හී අනු අංක vi යටතේ සඳහන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන හැකියා ප්‍රවර්ධන මට්ටම - II පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර සහතිකය ලබා තිබීමේ අවශ්‍යතාවය සලකා බලනු නොලැබේ.

**2.6)** II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස්වීම සඳහා ලබා තිබිය යුතු, සංශෝධිත ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 13.2 (අ) හි අනු අංක v යටතේ වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2015 හා ඊට අනුශාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති සහන කාලයන් තුළ සම්පූර්ණ කරන නිලධාරීන් නියමිත දිනට දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළා සේ සලකනු ලැබේ.

මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අනුව නිකුත් කරනු ලැබේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය